Please check the examination details below before entering your candidate information

| Candidate surname | Other names |
|---|---|
| | |

Centre Number | Candidate Number

# Pearson Edexcel International GCSE (9–1)

## Monday 2 June 2025

Afternoon (Time: 2 hours 30 minutes)

**Paper reference** **4SI1/01**

# Sinhala

## PAPER 1: Reading, Writing and Translation

**You do not need any other materials.**

Total Marks

## Instructions

- Use **black** ink or ball-point pen.
- **Fill in the boxes** at the top of this page with your name, centre number and candidate number.
- There are **three** sections you must answer:
  – Section A Questions 1–4
  – Section B Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c)
  – Section C Question 7.
- Answer the questions in the spaces provided
  *– there may be more space than you need.*
- You must **not** use a dictionary.

## Information

- The total mark for this paper is 100.
- The marks for **each** question are shown in brackets
  *– use this as a guide as to how much time to spend on each question.*

## Advice

- Read each question carefully before you start to answer it.
- Check your answers if you have time at the end.

*Turn over* ▶



©2025 Pearson Education Ltd.
Y:1/1/1/1/1/

P 7 9 7 3 9 A 0 1 2 0

Pearson

## SECTION A

## Reading

**Answer ALL questions.**

**Write your answers in the spaces provided.**

**Multiple-choice questions must be answered with a cross in a box ☒ . If you change your mind about an answer, put a line through the box ☒ and then mark your new answer with a cross ☒ . Open-response questions do not have to be written in full sentences and you may respond using single words or phrases.**

**1** පහත සඳහන් පාඨය කියවා එම තොරතුරුවලට අනුව දී ඇති **සිංහල** වාක්‍යවල හිස් තැන් පුරවන්න. වගුවේ ඇති පිළිතුරුවලින් නිවැරදි පදය තෝරා ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය ඉදිරියෙන් ඇති කොටුව තුළ ලියන්න.

### අපේ ආහාර

දකුණු ඉන්දියානු හා යටත් විජිත සම්ප්‍රදායන්ගේ බලපෑමෙන් විචිත්‍රවත් වූ ආහාර සංස්කෘතියකින් ශ්‍රී ලංකාව පොහොසත් ය. මුහුදෙන් ලබා ගන්නා මත්ස්‍ය සම්පත හා ගොඩබිමෙන් නෙළා ගන්නා එළවළු, නැවුම් කුළු බඩු හා මිශ්‍ර කිරීමෙන් පිසින ලද ආහාර රස නහර පිනවයි. මිරිස් සැරට උයන ලද ආහාර අනුභව කිරීමට මෙරට ජනතාව වඩාත් කැමති ය. රටේ තැනින් තැන ගමන් කරන්නෙකුට දිවයිනේ විවිධ ප්‍රදේශවලට ආවේණික ආහාර වර්ගවල රස බැලිය හැකි ය.

ජනතාව අනුභව කරන ප්‍රධාන ආහාර වේලට මස්, මාළු, ධාන්‍ය වර්ග හා එළවළු වැනි ව්‍යංජන හා බත් අයත් ය. දහවල් ආහාරය සඳහා බත් සහ ව්‍යංජන නො ඉදෙන ගෙයක් හෝ ආපන ශාලාවක් නැති තරම් ය. උදෑසන ආහාර වේලට ඉඳි ආප්ප හෝ කිරිබත් ද, සවස් වේලට ආප්ප හා කොත්තු ද බෙහෙවින් අලෙවි වන කඩ කෑම වර්ග කිහිපයකි. පාර අයිනක ඇති තේ කඩයක එවෙලේ ම පිසින ලද පොල් රොටියක් හෝ ආප්පයක් ලුණු මිරිස් සමග කා තේ කෝප්පයක් බීම ගමනක් යන විට අත් නො හරින පුරුද්දකි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA



P 7 9 7 3 9 A 0 2 2 0

| | | | |
|---|---|---|---|
| **A** ~~ශ්‍රී ලාංකාවේ~~ | **B** කෑම | **C** ඉඳි ආප්ප | **D** රසවත් |
| **E** සමාන | **F** ආප්ප | **G** අඩුවෙන්ම | **H** ඉන්දියානු |
| **I** තේ | **J** වැඩියෙන්ම | **K** වර්ණවත් | **L** වෙනස් |
| **M** යුරෝපීය | | | |

| | | |
|---|---|---|
| **උදාහරණය:** | මෙය ශ්‍රී ලාංකාවේ ආහාර ගැන ලියූ රචනාවකි. | *A* |
| **1** (a) | රටට අනන්‍ය ......... වර්ග රාශියක් ඇත. | |
| **1** (b) | අපේ ආහාරවලට ......... ආභාෂය ලැබී ඇත. | |
| **1** (c) | කුළු බඩු නිසා ආහාර ......... වේ. | |
| **1** (d) | පළාත අනුව ......... වන කෑම ජාති ඇත. | |
| **1** (e) | බත් ......... අනුභව කරන ආහාරයකි. | |
| **1** (f) | ......... පිසින්නේ සවස් වරුවේ ය. | |

**(Total for Question 1 = 6 marks)**

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA



P 7 9 7 3 9 A 0 3 2 0

*Turn over*

**2** පවුලේ උදව්යත් සමග කටයුතු කරන ආකාරය ගැන කථා කරන මෙම ළමුන් තිදෙනාගේ ප්‍රකාශ කියවා එම තොරතුරුවලට අනුව පහත වගුව පුරවන්න. නිවැරදි කොටු 8 තුළ එක් කතිරය බැගින් යොදන්න. ඇතැම් වාක්‍යයකට හෝ පුද්ගලයෙකුට කතිර එකකට වඩා තිබිය හැකි අතර ඇතැම් විට එකක්වත් නොතිබිය හැකි ය.

**මොනිකා**



මගේ අම්මා කාර්ය බහුල වේලාවට මා ඇයට එළවළු සෝදන්න හා කපන්න උදවු කරනවා. එම හැකියාව ඉගෙන ගන්න මා කැමති නිසා ඇය මට උයන හැටි කියා දෙනවා. අපේ තාත්තා පාසලේ අතිරේක පන්ති නිමවා ගෙදර එන්නේ හුඟක් හවස් වෙලා ය. මල්ලිත් මාත් ගෙදර වැඩ නිමවා අපේ මිදුලේ ඇති සෙල්ලම් ගෙදර සෙල්ලම් කරනවා. මට පාසලෙන් දෙන ගෙදර වැඩවලට ගෙදර දී අම්මාගේත් තාත්තාගේත් උදවු ලැබෙනවා.

**ලක්ෂ්මන්**



අපේ තාත්තා මුදල් ඉපයීම සඳහා විසිතුරු මල් පැළ වගාවක් කරගෙන යනවා. ඔහුගේ මල් පැළවලට ප්‍රදේශවාසීන්ගෙන් ඉහළ ඉල්ලුමක් තිබෙන නිසා අපේ වියදමට එයින් සැලකිය යුතු ආදායමක් ලැබෙනවා. මම පාසල් කාලයෙන් පසුව මල්ලිගේ ගෙදර වැඩවලටත් තාත්තාගේ මල් පැළ වගාවටත් උදවු කරනවා. තාත්තා මල් පැළ විකුණා ගෙදර එන විට කුස්සියට බඩුත් අපට රස කැවිලිත් අරගෙන එනවා.

**අබ්දුල්**



මට නංගියි මල්ලිලා දෙන්නෙකුයි ඉන්නවා. අපි හතර දෙනා ම පාසල් යනවා. නංගිගෙයි මල්ලිලාගෙයි අධ්‍යාපන කටයුතුවලට මට හැකි ලෙස සහාය දෙනවා. තාත්තාත් අපේ ගෙදර වැඩවලට උදවු කරනවා. අම්මා සිය ව්‍යාපාරික රැස්වීම් නිමවා ගෙදර එන්නේ රෑ බෝ වී බැවින් අපේ අධ්‍යාපන කටයුතුවලට වැය කරන්න ඇයට කාලයක් නැති තරම්. ඒත් අපේ වියදම් දරන්නේ ඇය විසින් ය. මගේ බලාපොරොත්තුව හොඳින් ඉගෙන ගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ හොඳ නමක් දිනා ගැනීමයි.

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

| | | මොනිකා | ලක්ෂ්මන් | අබ්දුල් |
|---|---|---|---|---|
| **උදාහරණය:** | කුස්සියේ වැඩට හවුල් වෙයි. | ☒ | ☐ | ☐ |
| **A** | දෙමව්පියන්ට උදවු කරයි. | ☐ | ☐ | ☐ |
| **B** | පියා ගුරුවරයෙකු බව කියයි. | ☐ | ☐ | ☐ |
| **C** | පවුලේ ව්‍යාපාරය ගැන කථා කරයි. | ☐ | ☐ | ☐ |
| **D** | තම සොයුරු සොයුරියන්ට සහය වෙයි. | ☐ | ☐ | ☐ |
| **E** | ගණිතයට අකමැති බව කියයි. | ☐ | ☐ | ☐ |
| **F** | අනාගත අරමුණක් සඳහා වැඩ කරයි. | ☐ | ☐ | ☐ |

**(Total for Question 2 = 8 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**3** අපේ රටේ සිරිත් විරිත් පිළිබඳ පහත සඳහන් ලිපිය කියවන්න. ඊට පහතින් දී ඇති වාක්‍යවල හිස් තැන් **සිංහල** වචන යොදා පුරවන්න.

**අපේ සිරිත්**

ශ්‍රී ලාංකිකයින් වශයෙන් අපට උරුම සිරිත් විරිත්වලට හිමි වන්නේ ඉතා ඉහළ ස්ථානයකි. මෙම සිරිත් විරිත් සමුදාය තුළ පවතින ආචාර සමාචාර හා වත් පිළිවෙත් එහිලා ඉතා හොඳින් කැපී පෙනේ. දේශීය සම්ප්‍රදායට ගරු කරන වැඩිහිටි පිරිස කිසිවෙකු පිළිගැනීමේ දී සිය දෑත් එකට තබා හිස නමා ආචාර කිරීමට හුරු වී ඇතත් වත්මන් තරුණ තරුණියෝ බටහිර පන්නයට අතට අත දීමට වැඩි කැමත්තක් දක්වති.

සිරිත් විරිත් යනු ක්‍රමයෙන් වෙනස් වෙමින් පැවත එන දෙයකි. කාන්තාවෝ තම පවුලෙන් පිට පිරිමින් සමග සෘජු සම්බන්ධතා පවත්වන්නට මැළිකමක් දැක්වූ නමුත් දැන හඳුනා ගැනීමෙන් පසු ඔවුහු මිතුරන්ගේ සමීප ඇසුර ප්‍රිය කළහ.

ශ්‍රී ලාංකිකයෝ ආගන්තුක සත්කාරයට කැමති ජාතියක් ලෙස ලොව ම හඳුනති. හිත මිතුරන්ට සලකමින් විනෝදය පිණිස ප්‍රිය සම්භාෂණ හා සාද පවත්වන ඔවුහු ඥාතින්ට සැලකීම සිය යුතුකමක් ලෙස සලකති.

ආගමික නැඹුරුවක් ඇති රටක් ලෙස ශ්‍රී ලාංකිකයෝ තම ආගමික විශ්වාසවලට ගරු කරති. පූජනීය ස්ථානයකට ඇතුළු වන විට ඔවුහු තම සිරුර ආවරණය වන පරිදි සුදුසු ලෙස ඇඳ පැළඳ ගනිති.

ඔවුහු සෑම විටම පන්සල්වල තම හිස් වැසුම් සහ පාවහන් ඉවත් කළත් ඇතැම් පූජනීය ස්ථානවල පිරිමින්ගේ කමිස ද ඉවත් කරීම සිරිතකි. ප්‍රසිද්ධියේ අනුරාගී හැඟීම් ප්‍රකාශ කිරීම වැනි ඇතැම් ඉරියවු රට තුළ එතරම් ප්‍රචලිත නොවෙතත් ආදරය ප්‍රකාශ කිරීම සඳහා සම්මත සිරිත් සමුදායකින් මෙරට සංස්කෘතිය පොහොසත් ය.



DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**උදාහරණය:** මෙම රචනාවෙන් ශ්‍රී ලංකාවේ ................................ **සිරිත් විරිත්** ................................ ගැන කියවෙයි.

(a) සිරිත් විරිත් අතර ඇති ප්‍රධාන අංග දෙකක් වන්නේ

..............................................................................

හා .............................................................................. ය. **(2)**

(b) ශ්‍රී ලාංකිකයින් එකිනෙකාට ආචාර කරන ප්‍රධාන ක්‍රම දෙකක්

..............................................................................

හා .............................................................................. ය. **(2)**

(c) සිරිත් විරිත්වල විශේෂ ලක්ෂණය වන්නේ

.............................................................................. පැවතීමයි. **(1)**

(d) කාන්තාවන් සම්බන්ධ විශේෂත්වය වූයේ ..............................................................................

හා .............................................................................. ය. **(2)**

(e) ශ්‍රී ලංකාව .............................................................................. ලෝක ප්‍රකට ය. **(1)**

(f) ශ්‍රී ලාංකිකයෝ .............................................................................. මෙන් ම

.............................................................................. ද එකසේ සලකති. **(2)**

(g) ඇතැම් පූජනීය ස්ථානවල ..............................................................................

සුවිශේෂ චාරිත්‍රයකි. **(1)**

(h) .............................................................................. පෙන්වීම විවෘතව නොකෙරේ. **(1)**

**(Total for Question 3 = 12 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

4 පූජ්‍ය බටුවංගල රාහුල හිමියන් විසින් රචනා කරන ලද '**අලුත් නගරාධිපති**' නමැති කෙටි කතා සංග්‍රහයෙහි එන 'වහල් දූපත' නම් කෙටි කතාවෙන් උපුටා ගත් පහත සඳහන් ඡේදය කියවන්න.

**සංචාරකයෙකුගේ අත්දැකීම්**

"වික්‍රමදාස එංගලන්තයට ගියේ කෙටි සංචාරයක් සඳහා ය. ඔහුට ශෙරි මුණ ගැසුණේ එහි උද්‍යානයක් තුළ ඇගේ විකී නමැති සුරතලා සමග ඇවිදිමින් සිටිය දී ය. ඇය තේ පැන් සංග්‍රහයක් සඳහා එදින ඔහුට ආරාධනා කළ බැවින් පසු දිනක වික්‍රමදාස ශෙරීගේ නිවසට ගියේ ය.

මඳ සිනාවක් පෑ ශෙරි ඇගේ පාමුල ඇති චිත්‍රය දෙසත් වික්‍රමදාසගේ මුහුණ දෙසත් මාරුවෙන් මාරුවට බැලුවා ය.

විකී හා ඔහු අතර ඥාති සම්බන්ධයක් ඇතැයි ඇසීමෙන් වික්‍රමදාස තුළ කුමක් දෝ අමුතු හැඟීමක් ඇති විය.

'වික්‍රමදාස විශ්වාස කරන්න, උදේ මාව ඇහැරවීමේ ඉඳන් නිදන ඇඳට ගියාට පසු මට සීත කබාය පොරවන මොහොත දක්වා මෙයා මගේ වැඩ ගොඩක් කරලා දෙනවා.' ඇය සෙමින් විකීගේ පිට තම වම් පාදයට හසු කරගනිමින් කීවා ය.

විකී නගුට වනමින් ඇගේ කකුලේ යටි පතුළ ලෙවකමින් සුරතල් වූයේ ය.

'මට ලංකාවේ දී හොඳ මිනිස්සු මුණගැහිලා තියෙනවා. මං ලංකාවට හතර වතාවක් ගිහිං තියෙනවා. අපේ තාත්තා එක්ක තමා මං ඒ හතර වතාවෙ ම ගියේ. අවසන් වතාවට ගියේ මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා. ඒ වතාවේ මම අවුරුද්දකට ආසන්න කාලයක් එහේ හිටියා. ඒ එන ගමන් අපේ වත්තෙන් තමා මං මෙයාව අරන් ආවේ' යි කියමින් ඈ විකීගේ හොම්බ ඇගේ පා ඇඟිලිවලින් පිරිමැද්දා ය. විකී තම රටේම කෙනෙකු බව දැනගැනීමෙන් වික්‍රමදාස තුළ ඇති වී ගිය හැඟීම වෙනස් වූයේ නැත.

'තාත්තාට නුවර එළියේ තේ වත්තක් තිබුණා: අපේ රැජිනගෙ වත්තට කිට්ටුව ම වගේ. කොළඹත් තාත්තාට ව්‍යාපාර තිබුණා. අපි ලංකාවට ගියාම වැඩිපුර ම හිටියේ නුවර එළියේ.'

ඇය ලංකාවට ගොස් ඇති කෙනෙකු පමණක් නොව, ඇයට එහි වාසය කිරීමටද හේතු ඇති බව දැන ගැනීමෙන් වික්‍රමදාස විස්මයට පත් විය."

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**4** (a) පාඨයේ ඇති තොරතුරුවලට අනුව අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න. පිළිතුරු සඳහා සම්පූර්ණ වාක්‍ය ලිවීම අවශ්‍ය නොවේ.

(i) වික්‍රමදාස ශෙරිගේ නිවසට ගියේ ඇයි?

**(1)**

.......................................................................................................................................

(ii) ශෙරි හා වික්‍රමදාස මුණ ගැසුණු අවස්ථා දෙකක් **දෙකක්** ලියන්න.

**(2)**

.......................................................................................................................................

.......................................................................................................................................

(iii) සුරතලාගෙන් ශෙරිට ඇති ප්‍රයෝජන මොනවා ද? කරුණු **දෙකක්** ලියන්න.

**(2)**

.......................................................................................................................................

.......................................................................................................................................

(iv) විකී ශෙරිට සිය ලෙන්ගතුකම ප්‍රකාශ කළ ආකාරය දක්වන්න. කරුණු **දෙකක්** ලියන්න.

**(2)**

.......................................................................................................................................

.......................................................................................................................................

(v) විකී උපන්නේ කුමන රටේ ද?

**(1)**

.......................................................................................................................................

(vi) ශෙරි ශ්‍රී ලංකාවට ආදරය කරන බව අප දන්නේ කෙසේද?

**(1)**

.......................................................................................................................................

(vii) ශෙරි අනාගතයේ කුමක් කිරීමට කැමති වන්නේද?

**(1)**

.......................................................................................................................................

DO NOT WRITE IN THIS AREA

**4** (b) සුමුදු හා කමලනී යන දෙදෙනා අතර සංචාර ගැන කෙරන පහත සඳහන් සංවාදය කියවා අසා ඇති ප්‍රශ්නවලට **සිංහලෙන්** පිළිතුරු සපයන්න.

සුමුදු
රට රටවල තිබෙන සුන්දර ස්ථාන මෙන් ම ඓතිහාසික හා පුරාවිද්‍යාත්මක වටිනාකම් ඇති ස්ථාන සෑම අයෙකු ම නැරඹිය යුතු යැයි මා තදින් ම විශ්වාස කරනවා. එලෙස විශ්වාස කිරීමට මට සාධාරණ හේතු තිබෙනවා. අපේ රටේ ම වුණත් හෝටන් තැන්න වැනි මනරම් භූමි දර්ශනයක් නොදකින නෙත් කුමටදැයි මා ඔබෙන් අසනවා. සීගිරිය වැනි ලෝක උරුමයක් ගැන ඔබට අමුතුවෙන් විස්තර කළ යුතු යැයි මා සිතන්නේ නැහැ. සිත් පැහැර ගන්නා වෙරළ තීරවල ඇති උදා අසිරිය එහි ගොස් නරඹන ලෙස මා දෙස් විදෙස් සංචාරකයින්ට ආරාධනා කරනවා.

මෙරට සංචාරය කරන්නෙකුට සෑම නගරයකම පාහේ තමන්ගේ වියදමට සරිලන ආකාරයේ නවාතැන් පහසුකම් සුලභව තිබෙනවා. උදාහරණයක් ලෙස, ප්‍රධාන සංචාරක ගමනාන්ත ආසන්නයේ තරු පන්තියේ විවිධ මිල ගණන්වලට ගත හැකි හෝටල් කාමර හා සංචාරක නිකේතන පිහිටා තිබෙනවා. ඒවා අතර උසස් ම තත්ත්වයේ සුඛෝපභෝගී පහසුකම් සැපයෙන නවාතැන් මෙන්ම සාමාන්‍ය මට්ටමේ කාටත් සාධාරණ තානායම් ද ඔබට පහසු මිල ගණන්වලට ලේසියෙන් ම වෙන් කරවා ගැනීමට හැකි ය.

කමලනී
ඕනෑ ම රටක ඇති වටිනා ස්ථාන කළමනාකරණය කොට රටට ආදායමක් මෙන්ම සංචාරකයින්ට උසස් තත්ත්වයේ ගුණාත්මක සේවයක් සැපයීමයි අප විසින් කළ යුත්තේ. සංචාරක ගමනාන්තයකට යෑම සඳහා ප්‍රවාහන පහසුකම් දියුණු විය යුතු ම දෙයක් ලෙසයි මා කල්පනා කරන්නේ. විශේෂයෙන් ම පොදු ප්‍රවාහනය සුරක්ෂිතව හා සුවපහසුව සහිත ව නිසි වේලාවට පැවතීමත් සංචාරක ආකර්ෂණයට බෙහෙවින් ම අවශ්‍ය දෙයක්. පෞද්ගලික ප්‍රවාහන සේවා තිබිය යුතු නමුත් තෝරා ගැනීමක් තිබීම සංචාරකයින්ට ඉතා පහසු වෙනවා.

අද වන විට පාරිසරික සංචාරක කර්මාන්තය බෙහෙවින් ව්‍යාප්ත ව ඇති බැවින් ශ්‍රී ලංකාව වැනි විවිධ පරිසර පද්ධති ඇති රටක් ඒ ගැන කල්පනා කරන්නේ නම් ඒවායින් විපුල ප්‍රතිලාභ ලබා ගත හැකියි කියා මා විශ්වාස කරනවා. බලන්න, ගොඩ බිමේ රට වට කර මෙන් ම රට මැද පිහිටා ඇති විවිධ පරිසර පද්ධති හා සතා සිවුපාවා ද, මුහුදේ කොරල් පර මෙන්ම ඒ ආශ්‍රිත මත්ස්‍ය සම්පත හා මුහුදු පැළෑටි ද රටකට මොන තරම් ධන නිධාන ද? පරිසර හිතකාමී සංචාරකයින්ට ඒවා කෙතරම් අපූරු අත්දැකීම් වනු ඇද්ද?

(i) පළමු කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- ශ්‍රී ලංකාවේ නැරඹිය හැකි ස්ථාන: **(1)**
- සංචාරක නවාතැන් පහසුකම්: **(1)**

..............................................................................................................................................

..............................................................................................................................................

(ii) දෙවන කථිකයාගේ අදහස් සාරාංශ කරන්න.

- ප්‍රවාහනය: **(1)**
- පරිසර හිතකාමී සංචාර: **(1)**

..............................................................................................................................................

..............................................................................................................................................

**(Total for Question 4 = 14 marks)**

**TOTAL FOR SECTION A = 40 MARKS**



P 7 9 7 3 9 A 0 1 0 2 0

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

## SECTION B

### Writing

Answer Question 5 and **either** Question 6(a) **or** 6(b) **or** 6(c).

**Write your answers in the spaces provided.**

**5**

**කියවීම නැරඹීම සහ සවන් දීම**

| | |
|---|---|
| මගේ කැමති ම රූපවාහිනී වැඩ සටහන | අන්තර්ජාලය හරහා සංගීතයට සවන් දීම |
| මෑතකදී නැරඹූ චිත්‍රපටයක් | අනාගතයේ කියවීමට කැමති පොතක් |

වචන 85ක් පමණ භාවිත කරමින් ඔබ වින්දනය සඳහා මාධ්‍ය භාවිත කරන ආකාරය ගැන **සිංහල** වාක්‍ය රචනයක් ලියන්න. ඉහත සඳහන් වචන සියල්ල ම භාවිත කළ යුතු ය.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

DO NOT WRITE IN THIS AREA

**(Total for Question 5 = 14 marks)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**6** පහත සඳහන් විකල්ප තුනෙන් එකක් තෝරා ගෙන වචන 145ක පමණ සිංහල වාක්‍ය රචනයක් ලියන්න. ඔබ තෝරා ගත් විකල්පයට අදාළ ව පිළිතුරු සපයන්න.

## පළමු විකල්පය

(a)



ඔබ සිදු කරන ස්වේච්ඡා වැඩ ගැන රචනයක් ලියන්න. ඔබේ රචනාවේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- ඔබ ස්වේච්ඡා සේවකයෙකු වීමට කැමති හේතු
- ඔබ මෑතකදී කෙනෙකුට උදවු කළ ආකාරය
- අනාගතයේදී ඔබ ස්වේච්ඡා වැඩ කිරීමට කැමති තැන

**(26)**

## දෙවන විකල්පය

(b)

ඔබේ පවුල හදිසියේම පොහොසත් වීම ගැන යහළුවෙකුට විද්‍යුත් ලිපියක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- මිනිසුන් විශාල ලෙස මුදල් ළඟ තබා ගැනීමෙන් සතුටු වීමට හේතු
- ඔබේ පවුල පොහොසත් වීමට පෙර ඔබේ ජීවන රටාව
- අනාගතයේ එම මුදල් වියදම් කිරීමට ඔබේ පවුලේ අය සැලසුම් කරන ආකාරය

**(26)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

## තෙවන විකල්පය

(c) ඔබ සේවය කරන සංචාරක නියෝජිත ආයතනය සමග සංචාරක ගමනාන්තයකට යෑමට සංචාරකයින්ට ඒත්තු ගැන්වීමට අන්තර්ජාලයට බ්ලොග් සටහනක් ලියන්න. ඔබේ ලිපියේ පහත සඳහන් කරුණු ඇතුළත් විය යුතු ය.

- මෙම ස්ථානය පරිපූර්ණ නිවාඩු ගමනාන්තයක් වීමට හේතු
- ඔබේ සංචාරක නියෝජිත ආයතනය පසුගිය වසරේ සංවිධානය කළ නිවාඩු පැකේජයක්
- ලබන වසර සඳහා ඔබේ පෞද්ගලික ගමන් සැලසුම

(26)

**Indicate which question you are answering by marking a cross ☒ . If you change your mind, put a line through the box ☒ and then indicate your new question with a cross ☒ .**

Chosen question number: **Question 6(a)** ☒ **Question 6(b)** ☒ **Question 6(c)** ☒

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

**(Total for Question 6 = 26 marks)**

**TOTAL FOR SECTION B = 40 MARKS**



P 7 9 7 3 9 A 0 1 6 2 0

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

## SECTION C

### Translation into Sinhala

**Write your answer in the space provided.**

7 පහත සඳහන් ඡේදය **සිංහලට** නඟන්න.

I wake up early in the morning when it gets light. Then I sit down for a quick breakfast, as there is enough time for me to get ready for the day. It can be difficult to get the bus because there are often delays and traffic jams. I spent every afternoon last week doing revision for all the exams this summer. At home, we usually have dinner early in the evening, so that I can get to sleep before midnight. I am looking forward to becoming someone who can make a positive contribution to society.

**(20)**

DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA
DO NOT WRITE IN THIS AREA

DO NOT WRITE IN THIS AREA

**(Total for Question 7 = 20 marks)**

**TOTAL FOR SECTION C = 20 MARKS**
**TOTAL FOR PAPER = 100 MARKS**



P 7 9 7 3 9 A 0 1 8 2 0

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**



P 7 9 7 3 9 A 0 1 9 2 0

DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA DO NOT WRITE IN THIS AREA

**BLANK PAGE**

**Source information**

**Question 1**
Source: https://www.lonelyplanet.com/articles/what-to-eat-and-drink-in-sri-lanka

**Question 2**
© paul prescott/Shutterstock
© Jaromir Chalabala/Shutterstock
© Anthony Asael/Art in All of Us / Contributor

**Question 3**
Source: https://www.clevelandcollection.co.uk/blog/article/sri-lankan-customs-and-etiquette

**Question 4**
Source: Aluth Nagaradhipathi By Batuwangala Rahula Himi © Kbooks publishers, KSP Publishers, 2021

**Question 6**
© Larysa Amosova/Getty Images

**Question 7**
Source: https://www.vesl.org/2013/03/srilanka/